# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

(1

## තොරතුරු තාක්ෂණ සහකාර තනතුරට බඳවා ගැනීම (බාහිර )

- කළමනාකරුවන් විසින් ලබාදෙන මාර්ගෝපදේශ අනුව පරිගණක භාවිතයෙන් වාර්තා, ලිපි සහ අනෙකුත් ලේඛන සකස් කිරීම.
- අදාළ තොරතුරු සහ දත්ත එකතු කිරීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම.
- අංශ/ඒකක මගින් පවත්වාගෙන යා යුතු අන්තර්ජාලය, විද්‍යුත් තැපැල, වෙබ් අඩවි සම්බන්ධතා සහ මාර්ගගත වාර්තා සම්බන්ධ කටයුතු සිදු කිරීම .

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්:**

අ.පො.ස . සාමාන්‍ය පෙළ විභාගයේදී එක් වරකදී විෂයයන් 06ක් සමත් වී, ඉන් ඉංග්‍රීසි, ගණිතය සහ සිංහල/දෙමළ ඇතුළුව විෂය 04කට සම්මාන සාමාර්ථ ලබා තිබීම සහ අ.පො.ස උසස් පෙළ විභාගයේදී පොදු පත්‍රය හැර විෂයයන් 03ක් සමත් වී තිබීම .

සහ

කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන, අදාළ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 6 ට නොඅඩු ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම .

සහ

අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර 05ක සේවා පළපුරුද්දක් තිබිය යුතු වීම.

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතා ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.

<u>ලිඛිත විභාගයේ විෂයයන්:</u>

අ) භාෂා ප්‍රවීණතාවය සහ බුද්ධි පරීක්ෂණය – පැය 2 – ලකුණු 100
ආ) තනතුරට අදාළ විෂය දැනුම – පැය 2 – ලකුණු 100

තනතුරට බඳවා ගැනීමේ විභාගය සමත් වීම සඳහා, එක් එක් විෂයයට නියම කර ඇති ලකුණු වලින් අවම වශයෙන් 40%ක් සහ සමස්ත ලකුණු එකතුවෙන් අවම වශයෙන් 50%ක් ලබාගෙන තිබිය යුතුය.

**(4) වැටුප :-** TRC 8.1 -Rs. 99,846 (10x2112) -(10x2816)-(10x3519)-(10x4223) – 226,546

**(5) වයස** : අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස අවුරුදු 18ත් 35ත් අතර විය යුතුය.

**(6) අයදුම් කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk වෙතින් බාගත කරගත හැකිය..
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2026.06.01 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තොරතුරු තාක්ෂන සහකාර තනතුරට බඳවා ගැනීම (බාහිර)** යනුවෙන් සඳහන් කළ යුතුය.
6. **අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව " තොරතුරු තාක්ෂණ සහකාර තනතුරට බඳවා ගැනීම (බාහිර) - 2026" විය යුතුය.**
7. රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් 2026.06.01 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

**(7) පොදු කොන්දේසි**

1. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
2. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් සලකා බලනු නොලැබේ.
3. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ
4. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
5. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ ඊකියාවක නිරත වීම උදෙසා ඍජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.


**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**
**අංක .276**
**ඇල්විටිගල මාවත**
**කොළඹ 08**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

තොරතුරු තාක්ෂණ සහකාර  තනතුර සඳහා අයදුම්පත්‍රය (බාහිර )

1. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන් ) :මහතා ./ මහත්මිය ./ මෙනවිය ………………………………………………

2. සම්පූර්ණ නම ( ඉංග්‍රීසියෙන් ) : ……………………………………………………………………

3. සම්පූර්ණ නම ( සිංහලෙන් / දෙමළින්)  :………………………………………………………………..

4. ලිපිනය : ……………………………………………………………………

5. උපන් දිනය :……………………..    2026 . 05.25 දිනට වයස : ………………………….

6. දුරකථන අංකය .: ………………………

7. විද්‍යුත් තැපැල් ලිපිනය ……………………………………..

8. ජාතික හැඳුනුම්පත් අංකය : ……………………………………………..

9. ස්ත්‍රී/ පුරුෂ භාවය : ……………………………………………

10. අධ්‍යාපන සුදුසුකම් : ……………………………………………………………………

11.වෘත්තීය සුදුසුකම් : ……………………………………………………………….

12.සේවා පළපුරුද්ද ……………………………………………………………………

13. ඔබ රජයේ සේවයේ නියුක්ත නම්:

ආයතනය : ……………………………………………………….

තනතුර : ……………………………………………………..

14. අමුණා ඇති සහතික පිටපත්

1 ……………………………………………………………………

2……………………………………………………………………

3……………………………………………………………………

4……………………………………………………………………

15. අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි බව මම ගෞරවයෙන් ප්‍රකාශ කරමි. මෙම අයදුම්පතේ කිසියම්

තොරතුරක් අසම්පූර්ණව හෝ වැරදි ලෙස ඉදිරිපත් කිරීමෙන් ඇතිවිය හැකි ඕනෑම ප්‍රතිඵලයක් සඳහා වගකීම භාර ගැනීමට මම එකඟ වෙමි. තවද, මෙම අයදුම්පතෙහි සඳහන් සියලු

කරුණු මාගේ දැනුම අනුව නිවැරදි බවද මම සහතික කරමි.

දිනය : ………………………    අයදුම්කරුගේ අත්සන : ……………………………………..

16. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සඳහා)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන ……………………………………………………… මහතා/මහත්මිය/ මෙනවිය …………………………………………. තනතුරේ සේවය කරමින් සිටින අතර, ඔහුගේ/ඇයගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහු/ඇයට එරෙහිව කිසිදු

විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, අනාගතයේදී එවැනි ක්‍රියාමාර්ගක් ගනු ලබන බවට තීරණය කර නොමැති බවත් මම මෙයින් සහතික කරමි. තවද, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම ආයතනයේ සේවයෙන් මුදාහැරිය හැකි / නොහැකි බව මෙයින් දැනුම් දෙමි.

දිනය : ………………………

නම : ..........................................................................................................................................

තනතුර : - ...................................................................................................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව /ආයතනය : -……………………………………………………………………

නිල මුද්‍රාව :